# විවාහය තවමත් පරක්කුද?
# විවාහ දිවිය නීරසද?
# විඳින්නේ නැතිව විඳවනවද?
# ශනි - මංගල දෝෂයෙන් පීඩා විඳිනවද?

## මෙන්න ගැලවෙන ක්‍රමය

**ඔබගේ විවාහය තවමත් පරක්කුද? නැතිනම් ඔබට සුදුසු සහකරු හෝ සහකාරිය ජන්ම පත්‍රයට අනුව තාමත් මුණගැහුණේ නැද්ද? කෙතරම් මංගල යෝජනා ආවත් ඒවා එකක්වත් ඔබේ කේන්ද්‍ර සටහනට අනුව ගැළපුණේ නැද්ද? ගළපලා හොයලා බලලා තිබුණත් කෙරෙන පාටක් පේන්න නැතිද? මෙවැනි දහසකුත් ප්‍රශ්න මැද ඔබත් සිත් වේදනා විඳින අයෙක් නම් ඔබ කළ යුත්තේ කුමක්ද? ඒ පිළිබඳ ඔබ කෙතරම් දුරට දැනුවත් වී සිටින්නේද? එසේ පීඩා විඳින ඔබට මෙම ලිපිය වැදගත් වේවි කියා සිතමින් අද මම සෙනසුරු නිසා ඔබේ ජීවිතයට එල්ල වුණු පීඩාවෙන් මිදෙන්න හැකි ක්‍රමයන් ගැන දැනුවත් කිරීමටයි මේ සූදානම.**



ඔබේ කේන්ද්‍ර සටහනේ 7 වැනි භාවයේ ශනි - කුජ කියන ග්‍රහයන් සංයෝග වී හෝ යෝග වී හෝ ඉන්නවාද? මෙසේ සිටිනවා නම් එම ග්‍රහ තත්ත්වය විවාහ දෝෂයන් කැන්දන බව ඔබ දන්නවාද? එම දෝෂ තත්ත්වය ජ්‍යොතිෂයේදී ශනි මංගල දෝෂය ලෙසින් හඳුන්වන්නේය. මෙහිදී ශනි යනු සෙනසුරු ලෙසත්, මංගල යනු කුජ ග්‍රහයාට කියන තවත් නමක් ලෙසත් සඳහන් කළ යුතුය. මෙය කුජ - ශනි දෙදෙනාගේ සංයෝග වීමෙන් විතරක්ම නොවේ, එකිනෙකාගේ දෘෂ්ටියට හසුවීමෙන් පවා යෙදෙන්නේ වේ. එය අපි ජ්‍යොතිෂයට අනුව ගත්කල අර්ධ ශනි මංගල දෝෂය ලෙසද ගනු ලැබේ. වාසනාව අවාසනාව කරන මෙම පිහිටීම් දෙදෙනාගේම කේන්ද්‍ර සටහන්වල යෙදීම තුළින් මෙකී විවාහ දෝෂ තත්ත්වය භංග වී නියම ශුභ ඵල උදාකිරීමට සමත් වන බව ඔබ දන්නවාද? මෙසේ නොගැළපීම් මත සිදුවන විවාහයන් තුළ එකිනෙකා තනිවීම, අනෙක් කෙනාට දරුණු අනතුරු අවහිරතා ඇතිවීම, තමා නොසිතූ මොහොතක විපත්ති කරදරවලට මුහුණ දීමට සිදුවීම, ආර්ථික දුෂ්කරතාවන් උත්සන්න වීම, දියුණුවට ඇති මාර්ග අවහිර වීම ආදී වූ ඉතා අහිතකර තත්ත්වයන්ට මුහුණ දීමට පවා සිදුවනුයේ නිවැරැදිව විවාහ දෝෂ පරීක්ෂාවක් කර නිවැරැදි උපදෙස් මාලාවක් පිළිපැදීමට නොහැකි වීමෙන් බවත් මා මෙහිදී කිව යුතුව ඇත.

මෙම විවාහ දෝෂ කැන්දන ආකාර කිහිපයක්ම ජ්‍යොතිෂයෙහි මේ ආකාරයට සඳහන්ව ඇත.

- කුජ ග්‍රහයාගෙන් 4-7-8 යන භාවයක ශනිගේ පිහිටීම තිබීම.
- කුජගෙන් 4 වැන්නේ ශනි සිටීම.
- කුජ, ශනි එකම කොටුවක සිටීම.
- කුජගෙන් 7 වැන්නේ ශනි සිටීම.
- කුජගෙන් 8 වැන්නේ ශනි සිටීම.
- ශනි ග්‍රහයාගෙන් 3 වැන්නේ කුජ සිටීම.
- ශනිගෙන් 7 වැන්නේ කුජ ග්‍රහයා සිටීම.
- ශනිගෙන් 10 වැන්නේ කුජ ග්‍රහයා තැන්පත්ව සිටීම.

ඒ ආකාරයට මෙම අශුභ යෝගය උදාවන අතර, මෙම කේන්ද්‍ර සටහන් දෙකේම නිවැරැදි ලෙස බලා පරීක්ෂා කොට මෙම විවාහ දෝෂ කේන්ද්‍ර දෙකෙහිම යෙදුණේ නම් එම විවාහ යුග දිවිය ඉතා වීර්යවන්ත වූ, ධෛර්යසම්පන්න ව ... ද ආර්ථිකය අතින් ඉහළ ශක්තිමත්භාවයක් රඳන්නාවූද, මනා ගැළපීම් සහිත විවාහ දිවියකට උරුමකම් කියන්නේද වේ.

එබැවින් විවාහ කේන්ද්‍ර පරීක්ෂාවකදී නම් මෙකී සකලවිධ දෝෂ තත්ත්වයන් මැනැවින් පරීක්ෂා කළ යුතුව ඇත. එසේ නොවීම තුළ විවාහ සැපත අඩුවීම, යුගදිවි බාධා උත්සන්න වීම, කටුක අමිහිරි අසුන්දර අත්විඳීම් හමුවේ අසරණ වීම, යුගදිවි ගැටලු උත්සන්න වීම, දෙදෙනාට දෙදෙනා නොරිස්සීම, ලිංගික දුබලතා ඉස්මතු වීම, හදිසි අනතුරු මෙන්ම අකල් මරණ හමුවේ අසරණ වීම වැනි කලකිරීම්සහගත තත්ත්වයන්ට බොහෝ විට මුහුණ පාන්නට සිදුවනු ඇත. මෙහිදී මා තවදුරටත් සඳහන් කරනුයේ විවාහ කේන්ද්‍ර පරීක්ෂාවකදී මෙකී කරුණු අනුව ගත්කල එනම් ජ්‍යොතිර් විද්‍යාවට අනුව ගත්කල 7 වැනි භාවයේ හෝ 8 වැනි භාවයේ මෙම ශනි මංගල දෝෂ තත්ත්වයක් පෙන්නුම් කෙරේ නම් අනිවාර්යයෙන්ම එවැනි විවාහ ගිවිසාගැනීමක් සිදුවිය යුත්තේද එවැනිම වූ තවත් 7 වැන්නේ සහ 8 වැන්නේ එවැනිම වූ පාපී කේන්ද්‍රයක් සමග බව ඔබ මෙහිදී වඩාත් හොඳින්ම දැනගත යුතු කාරණා අතරින් එකකි. කෙතරම් දුරට පාපී දෝෂ සහිත කේන්ද්‍ර සටහනක් වුවද කේන්ද්‍ර ගැළපීමේදී නම් ශනි මංගල දෝෂයට නොගැළපෙන ආකාරයෙන් පිහිටියේ නම් එම කේන්ද්‍ර විවාහ සඳහා නොගත යුතුව ඇත.

ඉහත කී ග්‍රහයන්ගේ අංශක ගණන ගැන බලා ඒ අනුව මෙකී දෝෂ තත්ත්වයන්වල බලපෑම අවම වන අවස්ථාව අපට විද්‍යමාන වී ඇත. එයට හේතුව භාවකේන්ද්‍ර සටහනේ සටහන් වන ආකාරයට අනුව මෙම තත්ත්වය වෙනස් වීමක් පෙන්නුම් කෙරෙනු ඇත. එම නිසා දුටු විගසම බියවීමද එතරම් ශුභ නොවනු ඇත. කරුණු කාරණා මැනැවින් විමසා බලා තීරණයකට එළැඹීමට ඔබ දක්ෂ විය යුතුය.

දැඩි ආත්ම ශක්තිය ඇති, ඉතා කාර්යශූර, එඩිතර, තාක්ෂණික, කාර්මික, ඉංජිනේරු වෘත්තීන්වල නියැළෙන බොහෝ දියුණු වන පුද්ගලයන් මෙම යෝගය හරහා ලොවට දායාද වී ඇත. ඒ වගේම මෙම ශනි මංගල යෝගය පිහිටි ස්ථාන අනුව මෙන්ම යෝගකාරක ග්‍රහයන්ගේ ග්‍රහ තත්ත්වය මෙන්ම මොවුන් බැඳී සිටි නැකැත් හිමි අධිපතීන් උපඅධිපතීන් නවාංශකයේ ශුභ ලෙස පිහිටීම ආදී බොහොමයක් කාරණා සොයාබලා මෙම තත්ත්වය පිහිටීම ගැන නිරීක්ෂණයකට ආ යුතුව ඇත. බොහෝ ප්‍රසිද්ධ, වෙහෙස නොබලා වැඩ කරන, දියුණුවේ මාවත් තනන මෙකී පුද්ගලයන්ගේ තරමක් දරදඬු අහංකාර ගති පැවැතුම්ද නැත්තේම නොවේ.

මේවාට පිළියම් වශයෙන් නිවැරැදි කේන්ද්‍ර පරීක්ෂාවක් කළ පසුව සෙත්කවි රචනා කිරීම, බාරහාර වීම, වත්පිළිවෙත් නිවැරැදි ලෙස කිරීම, දෙවියන්ට භාර වීම, අවිවාහක අයට උදව් උපකාර කොට විවාහ කරදීම ආදී පිළියම් බොහොමයක් ජ්‍යොතිර් විද්‍යාව හරහා ලොවට හෙළිදරව් කර ඇති අතර, නිවැරැදි ජන්ම පත්‍ර පරීක්ෂාවක් කිරීම තුළින්ම මේ සඳහා නිවැරැදි වත්පිළිවෙත් ආරම්භ කළ යුතුව ඇත.

තවත් මෙවන් වූ කරුණු ඇසුරින් ඔබව දැනුවත් කිරීමට ලබන සතියේදීත් හමුවන තුරු ඔබ සැමට සියලු යහපතම උදාවේවායි පතමි.

**ජ්‍යොතිර්වේදිනී පී.එම්. සංජීවී වසන්ති**



*ජ්‍යොතිර් විද්‍යා ඩිප්ලෝමාධාරිනී / ජ්‍යොතිෂ ශිරෝමනී, ජ්‍යොතිෂ අවිශ්කාර් විශිෂ්ට ගෞරව සම්මානලාභිනී, සෙත්කවි ශාස්ත්‍ර විශාරද විශිෂ්ට ගෞරව සම්මානලාභිනී*
*සංජීවී ජ්‍යොතිර් පියස*
*දුරකතන - 0777 130391*

# හෝර්ටන් තැන්න හැදුවේ බළන්ගොඩ මානවයාමද?

## අලුත්ම අනාවරණයක්

**ලෝක මානවයා ගැන කතාකරන අපට අපගේ මානව ඉතිහාසය ගැනද සාඩම්බර විය හැකි, අගනා ඉතිහාසගත උරුමයකට හිමිකම තිබේ. ඒ ඉතිහාසය පිළිබඳ පුරාවිද්‍යානුකූලව විමසා බැලීම මෙම ලිපියේ අරමුණය.**

ලෝකයේ සමශීතෝෂ්ණ කලාපීය රටවල හිම යුගයක් පැවතිණි. එම ප්ලයිස්ටොසීන අවධියේ වර්තමානයේ අප වෙසෙන ශ්‍රී ලංකාවේද ආදිතම මානවයන් ජීවත් වී සිටි බවට අගනා සාධක පවතී. මෙම අවධිය වනවිට වඳවී ගොස් ඇති හස්ති විශේෂ, හිපපොටේමස් හා රයිනෝසිරස් ආදී සතුන්ගේ හමුවී ඇති පොසිල කොටස් ද එයට කදිම සාක්ෂියක් වෙයි. මානව වානරයකු ලෙස සැලකෙන හෝමෝ පිතකස්ගේ දත් කිහිපයක්ද ඒ පිළිබඳ කරනු ලැබූ පර්යේෂණවලදී හමුව තිබේ. ඒ විතරක් නොවේ, 'හෝමෝ සිංහලෙයෙවුස්' ලෙස නම්කර තිබෙන පැරණි මානවයකුගේ අවශේෂ ද හමුවී ඇත. මෙකී සොයාගැනීම්වල කාලයද වසර පනස් දහසේ සිට වසර ලක්ෂ දෙකක් (වසර 50, 000 - 200,000) අතර යැයිද අනුමාන කෙරේ.

එසේම රත්නපුර මැණික් නිධිවලින් ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් නිපදවන ලද ගල් ආයුධ රැසක් ද සොයාගෙන ඇත. මෙම ආයුධ සොයාගනු ලැබුවේ ස්ථරානුකූලව නොවන නිසාවෙන් කාල නිර්ණය කිරීමෙහිලා යම් අපහසු තත්ත්වයක් පැනනැගී තිබිණි. ඒ හැර ඉහත ස්ථානවලින් මෙන්ම තව තවත් ස්ථාන රැසකින් සොයාගනු ලැබූ රළු දළ ගල් මෙවලම් නිසාවෙන් මේ රට තුළ මහා ශිලා අවධියක් පැවැතී ඇති බවට නම් දළ තීරණයකට එළැඹිය හැකිය.

මධ්‍ය ශිලා යුගය පිළිබඳ නම් මූලික වශයෙන්ම අප රට තුළදීම නිවැරදි සාධක ලැබී තිබේ. ක්ෂුද්‍ර ශිලා මෙවලම් කර්මාන්තය සඳහා එදා මෙරට විසූ ජනතාව තිරිවාණා සහ කහඳ වැනි පාෂාණයන් භාවිත කර ඇති බව දක්නට ලැබේ. මෙය සුවිශේෂ ලක්ෂණයකි.

දැනට සොයාගෙන ඇති මානව විද්‍යාත්මක ලක්ෂණ අනුව පෙනීයනුයේ මධ්‍ය ශිලා යුගයේ මානව වර්ගය වන්නේ බළන්ගොඩ මානවයාය. මධ්‍ය කඳුකරයෙන් හා බටහිර කඳු ප්‍රදේශවලින් බළන්ගොඩ මානවයාගේ සංස්කෘතිය පිළිබඳ අගනා තොරතුරු රැසක්ම අනාවරණ කරගෙන තිබේ.

මෙයට වසර හැත්තෑවකට පමණ පෙර, එනම් 1956 - 61 කාලවකවානුවේදී පුරාවිද්‍යාඥ පී.ඊ.පී. දැරණියගලයන් විසින් බෙල්ලන්බැඳිපැලැස්ස ප්‍රදේශයේදී සිදුකරන ලද කැණීම්වලින් මෙරට ප්‍රාග් ඉතිහාසය සහ බළන්ගොඩ මානවයා පිළිබඳ වැදගත් වූ සාධක රැසක් සොයාගැනීමට සමත් විය. එහිදී සිදුකරන ලද කැණීම්වලදී හමුවී ඇති අවශේෂයන් අතර මිනිස් ඇටසැකිලි දොළහක පමණ කොටස් සොයාගෙන තිබිණි. මෙකී අවශේෂ පිළිබඳ එවක කේ.එල්.ආර්. කෙනඩි සහ දැරණියගල යන පුරාවිද්‍යාඥයන් දෙපළ එක්ව සිදුකරන ලද පරීක්ෂණවලදී මිනිසාගේ අවධි තුනක් පිළිබඳ කදිම මත තුනක් ඉදිරිපත් කර තිබිණි. ඒ අනුව එම අවදි තුන,

01. හෝමෝ සිංහලෙයුස් (නියැන්ඩර්තාල්)
02. හෝමෝ සිංහලෙයුස් (ඉරෙක්ටස්)
03. හෝමෝ සෙපියන් බළන්ගොඩෙන්සීස් වෙයි.

අප රටේ (ශ්‍රී ලංකාවේ) ප්‍රාග් ඉතිහාසය විමසා බලන විට එය ගොඩනැගීමේදී ලංකාවේ උතුරු දෙසත්, දකුණුදිග වෙරළබඩත් පිහිටා තිබූ රතු පැහැති වැලි සහ පස් තට්ටු වඩා වැදගත් බවක් පවතින බව පුරාවිද්‍යාඥයකු වූ වේලන්ඩ් පෙන්වා දී ඇත. ඒ මෙයට හරියටම වසර එකසිය එකොළහකට පෙර, එනම් 1915 වසරේදීය.

එසේම පුරාවිද්‍යාඥ සිරාන් දැරණියගලයන් විසින් ඉරණමඩු සංයුතිය නමින් එවක හඳුන්වනු ලැබූ මෙකී ස්ථරවල නියමාකාර ලෙස පර්යේෂණ අරඹනු ලැබුවේ හැත්තෑව දශකයේදීය. මෙකී සංයුතියට අයත් වූ බූන්දල ප්‍රදේශයේ ලෙවන්ගොඩ, වැල්ලෙගංගොඩ, පතිරාජවෙල යන ප්‍රදේශවල සිදුකරන ලද කැණීම්වලින් මධ්‍ය ශිලා යුගයට අයත් ගල් මෙවලම් ලක්ෂ දෙකකට අධික ප්‍රමාණයක් සොයාගනු ලැබීය.

මෙම වෙරළබඩ ප්‍රදේශයේ පැවැති ජ්‍යාමිතික හැඩය සහිත මධ්‍ය ශිලා යුගයේ ගල් මෙවලම් දකුණු ඉන්දියාවේද එයට සමාන පස් තට්ටුවලින්ද සොයාගෙන තිබිණි. එසේ හමුවූ එම සාධක අදින් වසර විසිපන් දහසකට පමණ එහා ඉතිහාසයක් පවතින බවටද නිගමනය කෙරිණි. ඒ තාප සංදීප්තතා කාල නිර්ණය සලකාය.

එසේම එකී පස් තට්ටුවලට මීටර් හතක් පමණ යට පිහිටි පස් තට්ටු වෙනුවෙන් ලබාගෙන ඇති කාල නිර්ණ වසර 74,000 - 64,000 අතර වූ බැව් ප්‍රකාශ විය. එකී පස් තට්ටු තුළින් ලබාගන්නා ලද ශිලා මෙවලම් ඉතාම ආදීම ලක්ෂණ පිළිබිඹු කර තිබිණි. තවද ඉරණමඩු සංයුතියට අයත් වන පතිරාජවෙලින් හමුව තිබූ කළපු බෙල්ලන්ගේ අවශේෂවලට ක්‍රි.පූ. 3,310ක ඉතිහාසයක් පවතින බවද පෙනී ගියේය. මෙය ඉන්දියානු කාල නිර්ණය සමග ගැළපීමක් නොතිබුණද එහි ඉතිහාසය අවම වශයෙන් වසර 28,000කට එපිට අවධියක් එකී සංයුතියේ මධ්‍ය ශිලා යුගයේ ක්ෂුද්‍ර මෙවලම් අයත් විය හැකි බවට පුරාවිදූ මත පළකෙරිණි.

ශ්‍රී ලංකාවේ ශිලා ලේඛන අධ්‍යයන කටයුතුවලට මුල් අවධියේ පදනමව පැවතුණේ යුරෝපීය නියමයන් බවද පැවසේ. එසේ වුවද යුරෝපයේ මධ්‍ය ශිලා මෙවලම් නිර්මාණ යුගය ලෙස සැලකෙනුයේ අදින් වසර 12,000 කට එපිටය. ඒ අවසාන ග්ලැසියර් අවධියේ නිමාව සිදුවූ සමය වේ.

තත්ත්වය එසේ වුවද අප රටේ මෙකී ජ්‍යාමිතික ශිලා මෙවලම් නිර්මාණය අදින් වසර 35,000ක පමණ පෙර සිට පැවැතී ඇති බවට සාධක සොයාගෙන තිබීම අතිශය සතුට දනවන කරුණකි. ඒ ශ්‍රී ලාංකික මානව ඉතිහාසය ඒසා දුරකට පැතිර තිබූ බවට පවතින සාධක නිසාවෙනි. ඒ වෙනුවෙන් වැදගත්ම සාධක රැසක් අප රට අභ්‍යන්තරයෙන්ම ලැබී තිබේ. උදාහරණයක් ලෙස සලකන විට



මානියන්ගම බෙලිලෙන, රාවණා ඇල්ල, හෙණගහපුගල, බණ්ඩාරවෙල, කිතුල්ගල බෙලිලෙන, කෑගල්ල අළුලෙන, කුරුවිට බටදොඹ ලෙන, බෙල්ලන්බැඳිපැලැස්ස, පාහියන් ලෙන යනාදී ස්ථානවලදී මෙකී සාධක හමුවී තිබේ. එසේ බලන විට ඉහත කී මෙවලම් කර්මාන්තය භාවිත කළ 'බළන්ගොඩ මානවයා' අප රට පුරාම ව්‍යාප්තව සිට ඇති බවට මේවා කදිම සාක්ෂිය. අප රට පුරාම මෙකී සංස්කෘතියට අයත් ප්‍රාග් ඓතිහාසික ජනාවාසද විශාල ප්‍රමාණයක් හමුවී ඇති අතර, එවැන්නක් හමුනොවී ඇත්තේ යාපනය අර්ධද්වීපයෙන් පමණි.

තවද කුරුවිට - බටදොඹ ලෙනෙන් හමුවී තිබෙන ජ්‍යාමිතික ශිලා ක්ෂුද්‍ර මෙවලම් මෙයින් වසර 11,500 - 28,500 දක්වා කාල නිර්ණය කොට ඇති අතර, බූන්දලින් ලැබී තිබුණු ගල් ආයුධවල කාල පරාසය වසර 28,000කට අයත් වන බවය. එසේ බලන විට බූන්දල සහ කුරුවිට පැරණිම සාධක විමසීමේදී එක හා සමාන බවද පෙනේ. එයින් ගම්‍ය වන්නේ මෙකී මානවයා වෙරළාසන්නයේත්, රට අභ්‍යන්තරයේත් එකම කාල පරාසයක් තුළදී පැතිර ගොස් සිට ඇති බවය. ඒ අනුව ඉහත සාධක සනාථ කරනුයේ අප රටේ මධ්‍ය ශිලා යුගය අදින් වසර 25,000කට ඉපැරණි බවය.

එසේම 'බළන්ගොඩ මානවයා'ගේ මෙවලම් අතර තිබී සොයාගෙන ඇති සෙසු ආයුධ වන්නේ කහඳ සහ තිරුවාණාවලින් සාදාගෙන තිබූ විශාල කෙටීම් ආයුධ, කළුගල්, තිරුවාණාවලින් නිමවාගෙන තිබූ මිටි ලෙස භාවිත කළ ආයුධ සහ ඇඹරුම් ගල්ය.

මොවුන්ගේ ඇතැම් ගල් ආයුධ තුළින් ඔවුන් සතුව පැවැති උසස් ශිල්පීය දැනුම මොනවට විදහා පා ඇති බවද, එසේ හමුවී ඇති ඇඹරුම් ගල්වලින් පැහැදිලි වන්නේ තමන්ට ආහාරයට සුසුසු ධාන්‍ය ඒවා උපයෝගී කොටගෙන අඹරාගෙන ඇති බවය.

ඒ අතර මධ්‍ය ශිලා යුගයේ මානවයා තම ආහාර පිණිස සතුන් දඩයම් කර ඇති බවද, ඔවුන් වඩාත් මසට ගෙන ඇත්තේ මීමින්නා, වැලිමුවා, හාවා, ඉත්තෑවා වැනි කුඩා ක්ෂීරපායි සතුන් බවද හමුවී ඇති සාධක තුළින් සනාථ වේ. ඒ අතර ඉඳහිට විශාල සතුන් ආහාරයට ගෙන ඇති බවද පෙනේ. කෙසේ වෙතත් ඔවුන්ගේ ආහාරයේ ප්‍රධානම තැනක් බෙල්ලන්ට හිමිව තිබූ බවටද පවතින සාධක බොහෝය.

ශ්‍රී ලංකාවේ ඌව ප්‍රදේශයේ කඳුකර වනාන්තර එළිපෙහෙළි කරන්නටද ඔවුන් ක්‍රියාකර ඇති බව පෙනේ. මේ නිසාම බණ්ඩාරවෙල, හෝර්ටන් වැනි ප්‍රදේශයන්හි පතන මෙන්ම තෘණ භූමි ඇති කළාද විය හැකිය. එසේ කරන්නට ඇත්තේ ඔවුන්ගේ දඩයම් කටයුතුවලට එය පහසුවක් වන්නට විය හැකිය.

පුරාවිදූ සිරාන් දැරණියගලගේ මතය වන්නේ බළන්ගොඩ මානවයා හෙවත් මධ්‍ය ශිලා යුගයේ මිනිසා ඉන්දියාවෙන් පැමිණ ඇති බවය. ශ්‍රී ලංකාව ඉන්දියානු භූමිය සමග ක්‍රි.පූ. 9,000 වන තෙක්ම එක්ව පැවැතී ඇත. දෙරට අතර එදා ඇතිවූ සබඳතාව හේතුවෙන් මෙම මානවයා ඉන්දියාවෙන් මෙරටට සංක්‍රමණය වන්නට ඇත. කෙසේ වෙතත් හිමකඳු දියවීම හේතුකොට ගෙන මුහුදු ජල මට්ටම ඉහළ යාම නිසාවෙන් ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්ව තිබේ.

එසේ එක්ව තිබූ රට මුහුදු ජලය ඉහළ යාම නිසා රටවල් දෙකක් වීමේ ප්‍රතිඵලය කරණ කොටගෙන එදා ඉන්දියාවෙන් මෙරටට සංක්‍රමණය වූ මානව වර්ගයා මෙරට තනිවූවා විය හැකිය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ වෙසෙන වැදි ජනතාවට මෙම 'බළන්ගොඩ මානවයා' කායික වශයෙන් සමානත්වයක් උසුලන බවද පුරාවිදූ මතය වේ.



(පුරාවිද්‍යාඥයන් වන ආචාර්ය සිරාන් දැරණියගල හා ඊ.ජේ. වේලන්ගේ පර්යේෂණ තොරතුරු ඇසුරෙනි)

**නන්දන ඩී. කෙහෙල්ගමුව**

රතේගේ කොළම

# ගොවි රජවරු සහ කසිප්පුකාරයෝ

එදා කොළඹ පාරවල් දිගේ අමුඩ කෑලි ගසාගෙන, පාලකයන්ගේ සිංහාසන හොල්ලන්නට දහඩිය සුවඳ විහිදුවමින් ආ මිනිසුන් දෙස බලා ඇතැමුන් එදා කීවේ 'අන්න අපේ රටේ නියම ජීවය' කියාය. එදා දේශපාලන වේදිකාවල මයික්‍රෆෝන පළාගෙන, කටවල් ඇද කරමින් නාමල් කරුණාරත්නලා කෑගැසුවේ මේ රටේ බඩගින්න නිවන ගොවියාගේ අයිතිය ගැනය. 'අමුඩය' යනු හුදෙක් රෙදිකඩක් නොව, දේශපාලන බලය ලබාගැනීමේ ප්‍රබලම සංකේතයක් කරගනිමින්, එදා විපක්ෂයේ සිටි රතු සහ රෝස බලවේග ගොවියා වෙනුවෙන් පෙනී සිටියේ හරියට මඩේ බැස සිටි ගොවි ජනතාවගේ එකම ගැලවුම්කරුවන් තමන් පමණක් සේය. ගොවියාගේ කරවටක් ගිලී තිබූ ණය බර, පොහොර ප්‍රශ්න, සහ සහතික මිල වෙනුවෙන් එදා පාරට බැස්සවූයේ සැබෑ මිනිසුන්ය. එදා ඔවුන් සමග මඩේ බැස, අමුඩ ගසා, කුඹුරු ලියැදි මත සිට පින්තූරවලට පෙනීසිටිමින් 'අපි ආපු දවසට ගොවියා රජ කරවනවා' යැයි කී හැටි අදටත් මේ රටේ මිනිසුන්ට මතකය. නමුත් බලයේ මීපැණි රස වැටෙන විට, එදා කර තබාගෙන ආ සැබෑ මිනිසුන්ගේ 'අමුඩය' පරණ කඩමාල්ලක් බවට පත්වීමට වැඩි කලක් ගත නොවන බව වත්මන් දේශපාලන වේදිකාවේ හැසිරීම් දෙස බලන විට ඉතා පැහැදිලිය.

බලයේ සැප පහසුකම් ලැබුණු පසු, එදා තමන්ව කර තබාගෙන බලයට ගෙනා ගොවීන් දෙස බලන ඇස සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇත. එදා ගොවි ජනතාවගේ දුක කියමින් කඳුළු සැලූ ටී.බී. සරත් වැනි මැති ඇමැතිවරුන්ට දැන් තමන්ගේ අයිතීන් ඉල්ලා, සාධාරණ මිලක් ඉල්ලා කෑගසන ගොවියා පෙනෙන්නේ 'කසිප්පුකාරයන්' ලෙසය. තමන්ගේ අස්වැන්නට නිසි මිලක් නැතිව, වගාවට අවශ්‍ය යෙදවුම් ටික කරකියාගත නොහැකිව අසරණ වී පාරට බසින මිනිසුන් පිටුපස සිටින්නේ කුඩුකාරයන් හෝ කසිප්පුකාරයන් යැයි ලේබල් ඇලවීම තරම් තුච්ඡ දේශපාලන බංකොලොත්භාවයක් තවත් තිබේද? එදා ඒ මිනිස්සුන්ගේ දහඩිය මතින් බලයට ඇවිත්, අද ඒ මිනිස්සුන්ටම කසිප්පුකාරයෝ යැයි කියන්නට තරම් මේ දේශපාලකයන්ගේ හෘදය සාක්ෂිය මොට වී තිබීම සැබවින්ම කනගාටුදායකය.

මාලිමා මන්ත්‍රී අනුර පනාගොඩට අනුව, මේ දිනවල තමන්ගේ අයිතීන් ඉල්ලා විරෝධතාවල නිරත වන්නේ සැබෑ ගොවියන් නොව 'ආටිෆිෂල් ගොවියන්' කියාය. අපට අසන්නට ඇත්තේ එකම එක ප්‍රශ්නයකි. එදා රතු වේදිකාවලට, කොළඹ පාරවල්වලට අමුඩ ගස්සා කරත්ත පිටින් කැඳවාගෙන ආවේ 'ඇත්තම ගොවියන්' නම්, අද තමන්ගේම පාලනයක් යටතේ පාරට බැස තමන්ගේ බඩගින්න ගැන කෑගසන ගොවියා 'ආටිෆිෂල්' වන්නේ කෙසේද? දේශපාලන වාසිය වෙනුවෙන් ගොවියා සුරතලකු කරගැනීමත්, බලය ලැබුණු පසු ඔවුන්ව පාවාදී ප්‍රතික්ෂේප කිරීමත් ලාංකීය දේශපාලනයේ සාපකාරී උරුමයයි. එදා මඩේ බැස ගොවියා සමග පින්තූරවලට පෙනීසිටි නායකයන්, අද වායුසමනය කළ සුඛෝපභෝගී කාමර සහ නිල රථවල සිට ගොවියාගේ ආටිෆිෂල් බව මනින්නේ කුමන දේශපාලන තරාදියකින්දැයි මුළු රටම බලා සිටී.

මේ බල පුටුවල සිටින දේශපාලනඥයන් එකක් හොඳින් මතක තබාගත යුතුය. ගොවියා යනු කුඹුරේ මඩ තවරාගෙන සිටින තාක් පමණක් රවටන්නට, තමන්ට ඕනෑ ඕනෑ විදිහට නටවන්නට පුළුවන් නිද්‍රාශීලී මිනිසෙක් නොවේ. එදා ලංකා ඉතිහාසයේ පටන්ම මේ රටේ මහපොළොවේ දැවැන්තම ආණ්ඩු පෙරළුවේත්, අහංකාර පාලකයන්ව එක රැයින් ගෙදර යැව්වේත් ගොවියාගේ බඩගින්න, කඳුළ සහ ඒ බඩගින්නෙන් උපදින කෝපයයි. තමන්ගේ අයිතීන් වෙනුවෙන් සාධාරණව කෑගසන ගොවියාට කසිප්පුකාරයා යැයි කියමින් නිග්‍රහ කරන, ඔවුන් කෘත්‍රිම මිනිසුන් ලෙස හංවඩු ගසන ඕනෑම පාලකයකුට ඉතිහාසය දෙන උත්තරය කිසිසේත්ම ලස්සන එකක් වී නැත. ගොවියා තමන්ගේ ඇඟේ තැවරුණු මඩ ටික හෝදාගෙන, සැබෑ අයිතිය ඉල්ලා කොළඹට පැමිණි දවසට, අද ඔය උඩඟු කතා කියන, බලයේ මත් වී සිටින කොයි කාටත් අන්තිමට තමන්ගේ ගම් බිම් බලා රෙදි වැල් පිටින්ම, හිස් අතින්ම ගෙදර යන්නට සිදුවන දිනය වැඩි ඈතක නොවන බව ස්ථිරය. එදාට මේ කෘත්‍රිම ලේබල් වැදුණු සැබෑ මිනිසුන්ගේ පා පහරින් දේශපාලන සිංහාසන කුඩුපට්ටම් වී යනවා නොඅනුමානය.

රතේ!

# චීනෙ කොහොමද එහෙම වුණේ?
# ලෝකෙට ගැළපෙන්න අධ්‍යාපනය වෙනස් කරන්න බැරිද?



**චීනයේ අධ්‍යාපන ක්‍රමය සියවස් ගණනාවක් තිස්සේ සාම්ප්‍රදායික ව්‍යුහයක සිට නවීන, තාක්ෂණික සහ ගෝලීය මට්ටමේ ක්‍රමවේදයක් දක්වා කැපීපෙනෙන පරිවර්තනයන් රැසකට ලක්ව තිබේ. මෙම පරිණාමය ප්‍රධාන යුග පහක් ඔස්සේ මෙසේ විග්‍රහ කළ හැකි බව අන්තර්ජාලය ඔස්සේ කරන ලද සොයාබැලීමකින් හඳුනා ගතිමු.**

මුල් කාලයේදී පැරණි අධිරාජ්‍ය යුගය සහ කොන්ෆියුසියස් දර්ශනය අධ්‍යාපනයේ පදනම විය. මෙහිදී සදාචාරය, විනය සහ සාහිත්‍යය කෙරෙහි දැඩි අවධානයක් යොමු කෙරිණි. රාජ්‍ය සේවා විභාග ක්‍රමය ඒ අතර ප්‍රධාන තැනක් ගත්තේය. රටේ ඉහළ පාලන තනතුරු සඳහා පුද්ගලයන් තෝරාගනු ලැබුවේ අතිශය දුෂ්කර විභාග ක්‍රමයක් මගිනි. ඒ අතර බටහිර විද්‍යාව හෝ තාක්ෂණය වෙනුවට සම්භාව්‍ය සාහිත්‍යය මෙහිදී ප්‍රධාන විය. මෙම ක්‍රමය 1905 දී නිල වශයෙන් අහෝසි කරන ලදී.

සමාජවාදී පරිවර්තනය සහ සෝවියට් ආභාෂය චීන අධ්‍යාපන ව්‍යුහයට තදින්ම බලපෑවේ 1949දී මහජන චීන සමූහාණ්ඩුව පිහිටුවීමෙන් පසු, සාක්ෂරතාව ඉහළ නැංවීම සහ කම්කරු-ගොවි ජනතාවට අධ්‍යාපනය ලබාදීම මූලික ඉලක්කය විය. එතැනින් ඔවුන් නැවතුණේ නැත. සමකාලීන ලෝකය සමග ඉදිරියට යාම ඉලක්ක කරගත් චීනය සෝවියට් දේශයේ අධ්‍යාපන ක්‍රමය අනුගමනය කරමින් න්‍යායාත්මක අධ්‍යාපනය වෙනුවට ප්‍රායෝගික, කාර්මික සහ වෘත්තීය පුහුණු ආයතන වැඩි දියුණු කළේය.

පසුකාලීනව මාඕ සේතුංගේ සංස්කෘතික විප්ලවය සමයේ චීන අධ්‍යාපන ක්‍රමයට දැඩි බලපෑමක් එල්ල විය. විශ්වවිද්‍යාල සහ පාසල් වසාදැමුණු අතර විධිමත් විභාග ක්‍රම අත්හිටුවන ලදී. පොත්පත් සහ විද්‍යාත්මක පර්යේෂණ වෙනුවට දේශපාලන මතවාද සහ ශ්‍රම කඳවුරුවල වැඩකිරීම සිසුන්ට අනිවාර්ය විය. එය ලෝකයට කුමන ආකාරයකින් පෙනුණද චීනය නම් වාසියට හරවාගත් බව සිහිකළ යුතුය. මේ වනවිටත් ලෝකයේ පැවැති පරායත්තතා සංකල්ප වෙනුවට ස්වයාත්තතා න්‍යාය ඔවුන් අල්ලා ගත්තේය.

කලක් නැවතී තිබුණු බව කියන විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන ජාතික මට්ටමේ 'ගාඕකාඕ' විභාගය නැවත ආරම්භ කිරීම ඔවුන් සිදුකරන්නේ 1977දීය. ඉන් වසර පහළොවකට පමණ පසු සෑම දරුවකුටම වසර නවයක නොමිලේ සහ අනිවාර්ය ප්‍රාථමික හා කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය ලබාදීමේ නීතිය හඳුන්වා දෙන ලදී. ඒත් සමගම විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් බටහිර අධ්‍යාපන ක්‍රමවේදයන් ආදේශ කරගැනීම ඇරඹුණි.


නූතන අධ්‍යාපන ක්‍රමය හරහා ඩිජිටල්කරණය පිළිබඳව අවධානය යොමු කරන්නට මේ අය පටන් ගන්නේ 2010 වන විට. චීන විශ්වවිද්‍යාල ලෝකයේ ඉහළම ශ්‍රේණිගත කිරීම්වලට ඔසවා තැබීම සඳහා පර්යේෂණ සහ නව නිපැයුම්වලට රජය විශාල වශයෙන් ප්‍රතිපාදන වෙන් කරන්නට පටන් ගත්තේය. කෘත්‍රිම බුද්ධිය, ඩිජිටල් පන්තිකාමර සහ සැමට සමාන අධ්‍යාපන අවස්ථා ලබාදීම ඉලක්ක කරගත් නවීනතම අධ්‍යාපන ප්‍රතිපත්තියක් මේ වනවිට ක්‍රියාත්මක වේ.

චීන අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්තවලට අනුව, රටේ සංවර්ධන ඉලක්කවලට නොගැළපෙන සහ ශ්‍රම වෙළෙඳපොළේ ඉල්ලුමක් නොමැති යල්පැනගිය ප්‍රථම උපාධි පාඨමාලා 12,200ක් පමණ අත්හිටුවීමට හෝ සම්පූර්ණයෙන්ම පද්ධතියෙන් ඉවත් කිරීමට චීනය පියවර ගෙන ඇත.

ජාත්‍යන්තර මාධ්‍ය මේ කතන්දරය පැහැදිලි කර තිබුණේ එහෙමය. මෙය චීනයේ සමස්ත විශ්වවිද්‍යාල පාඨමාලා ප්‍රමාණයෙන් 30%කට වඩා වැඩි ප්‍රතිශතයකි. අවලංගු කරන ලද පාඨමාලා වෙනුවට නවීන තාක්ෂණය කේන්ද්‍ර කරගත් නව පාඨමාලා 10,200කට වඩා අලුතින් හඳුන්වා දීමට මේ අය වැඩපිළිවෙළක් හැදුවේය.

අන්තර්ජාලයේ සඳහන් වාර්තාවලට අනුව අවධානය යොමු කළ ක්ෂේත්‍ර මෙසේ දැක්විය හැකිය.

- කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence -AI)
- රොබෝ තාක්ෂණය (Robotics)
- ක්ෂුද්‍ර පරිපථ සහ සෙමිකන්ඩක්ටර් ඉංජිනේරු විද්‍යාව (Integrated Circuits / Semiconductors)
- Embodied Intelligence (භෞතික ලෝකය සමග ක්‍රියාකරන බුද්ධිමත් යාන්ත්‍රික පද්ධති) සහ Low-altitude Economy (ඩ්‍රෝන සහ ගුවන් අවකාශ තාක්ෂණික ආර්ථිකය).



### මානව ශාස්ත්‍ර හා භාෂා අධ්‍යයන අංශ සීමා කිරීම

2026 මැයි මාසයේ සිදුකළ සමීක්ෂණ වාර්තාවලට අනුව, කලින් විශාල ඉල්ලුමක් තිබූ විදේශීය භාෂා සහ පරිවර්තන වැනි මානව ශාස්ත්‍ර විෂය ධාරාවන් රැසක් සීමා කර තිබේ. ඒ වෙනුවට විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මාන්තය සහ වෛද්‍ය විද්‍යාව කෙරෙහි ශිෂ්‍ය බඳවා ගැනීම් වැඩිකර තිබේ.

'චීනයේ වාර්ෂිකව විශ්වවිද්‍යාලවලින් බිහිවන මිලියන 12කට අධික උපාධිධාරීන්ට ශ්‍රම වෙළෙඳපොළ තුළ රැකියා සොයාගැනීමේ අපහසුතාවක් (Graduate jobs crisis) පැවති බැවින්, ආර්ථිකයට සෘජුවම දායක විය හැකි වෘත්තීය නිපුණතා සහිත පිරිසක් බිහි කිරීම මෙහි අරමුණයි.'

ඔවුන් මේ වෙනස්කම ගැන දක්වා ඇත්තේ එවන් අදහසකි.

'අනාගත ලෝකයේ කෘත්‍රිම බුද්ධිය සහ උසස් නිෂ්පාදන කර්මාන්ත අතින් ලෝකයේ පෙරමුණ ගැනීමට අවශ්‍ය මානව සම්පත රට තුළම නිර්මාණය කිරීම චීන රජයේ උපායමාර්ගික සැලැස්මයි'.

වැඩිදුරටත් මේ ගැන කරුණු දක්වන මිස චීන ජනාධිපති 'අරවා ඉගෙන ගත්ත නං දෙන්න රස්සා නෑ ගෙදර යන්න' කියන්නේ නැත. විෂය ධාරා වෙනස් කරනවා මිස කරන විෂයයන්වලට රස්සා නොදී හැරීම රජයක වැඩක් නොවේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසු තව විභාග බුරුතු ගණන් ලියන්නට වීම අභාග්‍යයකි. එහෙම කරලත් උපාධියට ගැළපෙන රස්සාවල් නැත. රස්සාවල් සඳහා ගැළපෙන උපාධිධාරීන් නැත.

අවසානයේ අහන්නට වෙන්නේ මෙච්චරය. මෙච්චරමය. චීනෙට පුළුවන් නම් අපට බැරි ඇයි කියාය. ඒත් ඔච්චා අහලා වැඩක් නැත. චීනෙට පුළුවන් හුඟක් ඒවා අපිට හිතන්නටවත් බැරි බව සත්‍යයය.

ජීවන පහන් තිළිණ

PRIME RESIDENCIES
රාජගිරියේ LAKE DRIVE හි THE GOLF අරඹයි

BUSINESS TALK

ශ්‍රී ලංකාවේ දේපළ වෙළඳාම් ක්ෂේත්‍රයේ සැබෑ ප්‍රමුඛයා වන Prime සමූහ ව්‍යාපාරයේ අනුබද්ධ සමාගමක් වන Prime Residencies හි නවතම අධි-සුඛෝපභෝගී ව්‍යාපෘතිය වන THE GOLF ව්‍යාපෘතියේ ඉදිකිරීම් පසුගියදා නිල වශයෙන් ආරම්භ විය. මේ සඳහා මංගල පස් පිඩැල්ල කැපීමේ උත්සවය කොළඹ 08 ලේක් ඩ්‍රයිව්හි එම ව්‍යාපෘති පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට




ව්‍යාපෘතියට සම්බන්ධ වී සිටින විවිධ පාර්ශ්වවල නියෝජිතයන් විශාල පිරිසක් එක්වූහ.

මෙරට ප්‍රමුඛතම ගොල්ෆ් ක්‍රීඩා සමාජයක් වන කොළඹ රාජකීය ගොල්ෆ් ක්‍රීඩා සමාජයට යාබදව මෙම නිවාස ව්‍යාපෘතිය ඉදිකෙරෙනුයේ Prime Residencies සමාගමේ 'One Collection' නම් විශේෂ අධි-සුඛෝපභෝගී ව්‍යාපෘති එකතුවෙහි කොටසක් වශයෙනි. ඉතාමත් අලංකාර ගෘහ නිර්මාණ ශිල්පීය සැලසුම්වලට අනුව, ඉහළම තලයේ අමුද්‍රව්‍ය හා උපාංග පමණක් භාවිත කරමින්, නාගරික ජීවිතයේ පහසුකම් සමග සුඛෝපභෝගී ජීවන රටාවක සුවිශේෂත්වය එක්තැන් කරමින් මෙම නිවාස ඉදිකෙරේ. THE GOLF ව්‍යාපෘතියද එලෙස නාගරික වටාපිටාවත් ස්වභාවධර්මයත් සුසංයෝග කරන සුවිශේෂ ව්‍යාපෘතියක් ලෙස හැඳින්විය හැක.




# BCAS CAMPUS සහ LONDON SOUTH BANK UNIVERSITY (UK) ඒකාබද්ධ වෙයි

ශ්‍රී ලාංකේය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ නාමයක් වන BCAS Campus සහ London South Bank University (UK) සමග ඇති කරගත් නවතම අධ්‍යාපනික සබඳතාව 2026 ජූනි 15 දින නිල වශයෙන් ප්‍රකාශයට පත් කළේය.

මේ වෙනුවෙන් සංවිධාන කෙරුණු විශේෂ සමාරම්භක උත්සවය සහ මාධ්‍ය හමුව කොළඹ කින්ග්ස්බරි හෝටලයේදී පැවැත්විණි.

මෙම හවුල්කාරීත්වය ශ්‍රී ලාංකික සිසුන්ට ජාත්‍යන්තරව පිළිගත් බ්‍රිතාන්‍ය උසස් අධ්‍යාපන අවස්ථා තමන්ගේම මව්බිමේ සිටිමින් අඩු පිරිවැයකින් හැදෑරීමට ලැබෙන මහගු අවස්ථාවකි. මෙමගින් සිසුන්ට ලංකාවේ සිටම London South Bank University විෂයමාලා අනුගමනය කරමින් බ්‍රිතාන්‍ය උපාධි හිමිකර ගැනීමට මග පෑදේ.

මෙම නව අධ්‍යාපනික සබඳතාව යටතේ ප්‍රථමයෙන්ම ව්‍යාපාර කළමනාකරණය (Business Management) සහ නීතිය (Law) පිළිබඳ ප්‍රථම උපාධි පාඨමාලා මෙන්ම, පශ්චාත් උපාධි (MBA) පාඨමාලාවද හඳුන්වා දීමට පියවර ගෙන ඇත. ඉදිරියේදී තවත් ක්ෂේත්‍ර රැසක අධ්‍යාපනික පාඨමාලා මේ යටතේ හඳුන්වා දීමට ද නියමිතය.



# ඇමෙරිකාවයි චීනයයි ලංකාවට මෙහෙම ඇහැ ගහන් ඉන්නේ ඇයි?

**පසුගිය පෙබරවාරි මාසයේ ඇමෙරිකානු විදේශ සබඳතා කමිටුවේ දකුණු ආසියාව පිළිබඳ ඇමෙරිකා විදේශ ප්‍රතිපත්තිය ගැන සාකච්ඡා කරද්දී කමිටු සභාපති Bill Huizenga පවසා සිටියේ ශ්‍රී ලංකාව සහ මාලදිවයින ලෝක ආර්ථිකය සහ ඇමෙරිකාවේ ජාතික ආරක්ෂාවට කොතරම් වැදගත්ද යන්නය. එහිදී දකුණු සහ මධ්‍යම ආසියාව භාර ඇමෙරිකානු සහකාර ලේකම් පෝල් කපූර් ප්‍රතිචාර දැක්වූයේ ලංකාව සහ මාලදිවයින කුඩා සාගර රාජ්‍ය වුණේ භූගෝලීය පිහිටීම අනුව බවය. එවිට කමිටු සභාපති පවසා සිටියේ ලෝක තෙල්වලින් 75%ක් යන්නේ ශ්‍රී ලංකාවේ දකුණු මුහුදු තීරයට සැතපුම් ගණනක් ආසන්නයෙන් බවය. එවිට කපූර් කීවේ කන්ටේනර්වලින් හරි අඩක් මේ මුහුදු සීමාවේ නාවික ගමනාගමනය කරන බවත් මේ නිසාම ලෝක ආර්ථිකයට මේ රටවල් ඉතා වැදගත් යැයි කියාය. එහිදී හම්බන්තොට වරාය ගැනත් සාකච්ඡා වූ අතර හම්බන්තොට වරාය 99 අවුරුද්දකට බදු දීමෙන් ලංකාවේ ක්‍රියාකාරී නිදහස චීනයේ බලපෑමට නතු වී ඇති බව කපූර් කීවේය.**

කපූර්ගේ ලංකා සංචාරය කියවන්න ඕනා මේ සන්දර්භය තුළය. කපූර් ලංකාවට ඒමට පෙර යූ.එස්. පැසිෆික් එයාර් ෆෝස් කමාන්ඩර් ලංකාවේ සංචාරය කළේය. කමාන්ඩර් Kevin Schneider ගේ සංචාරය ශ්‍රී ලංකා සහ ඇමෙරිකානු ආරක්ෂක සබඳතා වර්ධනය වන ශක්තිය පෙන්වන්නක් බව මෙරට ඇමෙරිකානු තානාපති කාර්යාලය සඳහන් කර තිබිණි. ඔහුගේ ලංකා සංචාරය අතරතුරදී කපූර්ගේ පැමිණීම ශ්‍රී ලංකා ඇමෙරිකානු සබඳතා නව මානයකට ගෙන යන බව පෙන්වයි. ලෝක බැංකුවේ නේවාසික කළමනාකරු පසුගිය සතියේ වරාය ඇමැති හමුවූ වෙලාවේ පැවැසුවේ මැදපෙරදිග යුද්ධය නිසා කොළඹ වරාය ලෝක අවධානයට ලක්ව ඇති බවය.

මීට පෙර ඉන්දියාවේ ඇමෙරිකානු තානාපති සහ ට්‍රම්ප්ගේ විශේෂ නියෝජිත සර්ජියෝ ගෝර් ලංකාවට පැමිණ කොළඹ වරායේ නිරීක්ෂණ චාරිකාවක් කළේය. මේ සතියේ ලංකාවට පැමිණි කපූර්ද කොළඹ වරායේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූ බව තානාපති ආරංචි මාර්ග කියයි.

යූ.එස්. පැසිෆික් කමාන්ඩර් සහ කපූර්ගේ සාකච්ඡාවට පෙර මෙරට චීන තානාපති Qi Zhenhong පැලවත්තේ ජවිපෙ කාර්යාලයට ගොස් ජවිපෙ ලේකම් ටිල්වින් සිල්වා හමුවිය. ඔහු ටිල්වින් හමුවී චීන ජනාධිපති ෂී ජින් පින් රචිත 'ද ගවනන්ස් ඔෆ් චයිනා' ග්‍රන්ථයේ පස්වැනි වෙළුමේ ඉංග්‍රීසි පරිවර්තනය තෑගි කළේය. ටිල්වින් මෙයට කලකට පෙර චීනයේ සංචාරයක් නිමකොට පැමිණ චීන ආණ්ඩුකරණය ගැන අගය කරමින් කතා කළ අතර, ලංකාවද එම ක්‍රමය අනුගමනය කළ යුතු යැයි ඔහුට හමුවූ චීන බලධාරීන් කී බව ප්‍රකාශ කළේය.



## DFCC 'ගරුසරු' වෙතින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට අක්ෂි සත්කාර සඳහා සුවිශේෂ ප්‍රතිලාභ රැසක්

DFCC බැංකුව සිය ජ්‍යෙෂ්ඨ පුරවැසි ගනුදෙනුකාරභවතුන් වෙනුවෙන් පිරිනමන සුවිශේෂ වටිනාකම් සහ සේවාවන් තවදුරටත් ශක්තිමත් කරමින්, 'ඩDFCC ගරුසරු' ඉතිරිකිරීමේ ගිණුම් හිමි ජ්‍යෙෂ්ඨ පුරවැසි ඩෙබිට් කාඩ්පත් හිමියන් වෙත අක්ෂි සත්කාර සහ සුවතා ප්‍රතිලාභ රැසක් පිරිනැමීම සඳහා ප්‍රමුඛ පෙළේ අක්ෂි සේවා සැපයුම්කරුවකු වන Vision Care Optical Services ආයතනය සමග අත්වැල් බැඳගෙන ඇත.

මෙම සහයෝගිතාව යටතේ 'DFCC ගරුසරු' ඩෙබිට් කාඩ්පත්හිමියන්ට ඇස් කණ්ණාඩි, අව් කණ්ණාඩි සහ ශ්‍රවණාධාරක ඇතුළු තෝරාගත් Vision Care නිෂ්පාදන සඳහා 15% දක්වා විශේෂ වට්ටම් භුක්ති විඳීමේ අවස්ථාව හිමිවේ. මීට අමතරව, දිවයින පුරා පිහිටි ඕනෑම Vision Care ශාඛාවකින් නොමිලේ අක්ෂි පරීක්ෂණ සහ ඇසේ පීඩන පරීක්ෂණ (Eye pressure tests) සිදුකර ගැනීමටද කාඩ්පත් හිමියන්ට සුදුසුකම් ලැබෙනු ඇත.

සාම්ප්‍රදායික බැංකුකරණ අවශ්‍යතාවලින් ඔබ්බට යමින් ගනුදෙනුකරුවන්ට උපරිම අත්වැලක් සැපයීම සඳහාම විශේෂයෙන් නිර්මාණය කර ඇති 'DFCC ගරුසරු' ඉතිරිකිරීමේ සැලසුම හරහා, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ප්‍රායෝගික සහ එදිනෙදා ජීවිතයට අත්‍යාවශ්‍ය වන වටිනාකම් නිර්මාණය කිරීමට DFCC බැංකුව දරන අඛණ්ඩ උත්සාහය මෙම කාලීන පියවරෙන් මැනවින් පිළිබිඹු වේ.

## DIMO AGRI පංච මහා නිධානයෙන් 5කට DIMO BATTA

DIMO Agri Machinery විසින් LOVOL හාවස්ටර් පංච මහා නිධානය දිනුම් ඇදීමේ දෙවැනි අදියර පසුගියදා ඉතා සාර්ථකව අවසන් කරනු ලැබීය. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රජාවට වටිනාකමක් එක් කරන පාරිභෝගික ප්‍රවර්ධන වැඩසටහන් සඳහා DIMO හි අඛණ්ඩ කැපවීම මේ හරහා යළිත් තහවුරු විය.

මෙම වැඩසටහන යටතේ ප්‍රවර්ධන කාලසීමාව තුළ LOVOL හාවස්ටර් මිලදී ගත් වාසනාවන්ත පාරිභෝගිකයින් පස් දෙනකුට DIMO Batta සම්පූර්ණයෙන්ම නොමිලේ පිරිනමන ලදී. මේ සඳහා සුදුසුකම් ලැබූ කාලසීමාව 2025 ඔක්තෝබර් 01 සිට 2026 මාර්තු 31 දක්වා (මහ කන්නය) විය. මෙම දිනුම් ඇදීම 2026 මැයි මස 25 වැනිදා පැවැත්වුණු අතර,



වාහන භාරදීම ජූනි මස 02, 03, 04 සහ 05 දිනයන්හිදී එම DIMO Batta ජයග්‍රහණය කළ පාරිභෝගිකයන්ගේ නිවෙස් වෙතම ගොස් සිදුකෙරිණි.

පසුගිය වැඩසටහනේ සාර්ථකත්වය මත පදනම්ව, LOVOL හාවස්ටර් පංච මහා නිධානය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ කර්මාන්තයේ මෙතෙක් ක්‍රියාත්මක කර ඇති වටිනාකමෙන් ඉහළම සහ විශාලතම පාරිභෝගික ප්‍රතිලාභ වැඩසටහන් අතරින් එකක් ලෙස අඛණ්ඩව කටයුතු කරයි.



## SLT-MOBITEL GAMES මලල ක්‍රීඩා ශූරතාවලිය

SLT-MOBITEL Games 2026 ක්‍රීඩා උළෙල, සමාරම්භක වැඩසටහනේ කොටසක් ලෙස, 2026 SLT-MOBITEL මලල ක්‍රීඩා ශූරතාවලිය 2026 ජූනි 20 වැන දින කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී සාර්ථකව පැවැත්විණි. ආයතන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රමුඛතම වැඩසටහනක් ලෙස හැඳින්විය හැකි SLT-MOBITEL Games 2026 ක්‍රීඩා උළෙල, ක්‍රීඩාව සහ පොදු අරමුණක් තුළින් කාර්ය මණ්ඩල කණ්ඩායම්, එක් මිටකට එකතු කිරීම වෙනුවෙන්ම නිර්මාණය වුණු ක්‍රීඩා උළෙලකි. එසේම එකමුතුකමට අමතරව, කණ්ඩායම් හැඟීම සහ සෞඛ්‍ය සම්පන්න තරගකාරීත්වයක් පවත්වා ගැනීම ප්‍රවර්ධනය කිරීමද මෙම ක්‍රීඩා උළෙලේ පරමාර්ථයන් වී තිබේ.

චාරිත්‍රානුකූල ධජය එසවීමෙන්, ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන් විසින් සිදුකළ පිළිගැනීමේ කතාවන්වලින් මෙන්ම, බැලූන අහසට මුදාහැරීම සහ ඔලිම්පික් ගිනිසිළුව දැල්වීම වැනි සංකේතාත්මක ක්‍රියාකාරකම්වලින් වර්ණවත් වෙමින්, මෙම 2026 SLT-MOBITEL මලල ක්‍රීඩා ශූරතාවලිය ආරම්භ විණි. ඉන් අනතුරුව සම්පූර්ණ මලල ක්‍රීඩා වැඩසටහනක දිගහැරුමකින් පසු, සන්ධ්‍යා කාලයේදී පැවැත්වෙන සම්මාන ප්‍රදානෝත්සවයෙන් මෙම උළෙල සම්පූර්ණ විණි. ජවන සහ පිටිය ක්‍රීඩා ඉසව් සාර්ථකව නිම කිරීමෙන් පසු, බැඩ්මින්ටන්, ක්‍රිකට්, පාපන්දු, පිහිනුම්, වොලිබෝල්, චෙස්, කැරම් සහ නෙට්බෝල් ඇතුළු අනෙකුත් ප්‍රධාන ක්‍රීඩා තරගයන්, ඉදිරි සති කිහිපය තුළ පැවැත්වෙන්නට නියමිතව තිබේ.



## සුපිරි බ්‍රෑන්ඩ් රැසක් අරන් හේලීස් මොබිලිටි අනුරාධපුරයට

ලොවම පිළිගත් ප්‍රමුඛ පෙළේ රථ වාහන සන්නාමයන් වන JAECOO (ජේකූ), OMODA (ඔමෝඩා), KAIYI (කායි) සහ SRM (එස්.ආර්.එම්) මෙරට පාරිභෝගිකයන් වෙත සමීප කරන හේලීස් මොබිලිටි ලිමිටඩ් (Hayleys Mobility Limited) ආයතනය, CarSwitch (Pvt) Ltd. ආයතනය සමග අත්වැල් බැඳගනිමින් සිය නවතම බලයලත් විකුණුම් ප්‍රදර්ශනාගාරය අනුරාධපුරයේදී විවෘත කර තිබේ.

දිවයින පුරා විහිදුණු සිය සේවා ජාලය පුළුල් කිරීමේ තවත් එක් පියවරක් ලෙස විවෘත වූ මෙමගින් උතුරුමැද පළාතේ පාරිභෝගිකයන්ට හේලීස් මොබිලිටි සේවා ව්‍යාප්තිය තවදුරටත් සමීප කරයි. ඒ අනුව වාහන අලෙවිය, විශේෂඥ උපදේශනය මෙන්ම අලෙවියෙන් පසු සැපයෙන සේවාවන් ඇතුළු සියලු පාරිභෝගික අවශ්‍යතා, හේලීස් මොබිලිටි ආයතනයේ සුපුරුදු විශ්වසනීයත්වය සහ උසස් ප්‍රමිතියෙන් යුතුව දැන් එකම වහලක් යටින් ඉතා පහසුවෙන් ලබාගත හැකිය.

CarSwitch (Pvt) Ltd ආයතනය සිය බලයලත් විකුණුම් නියෝජිතයකු ලෙස පත්කරගැනීම, විශ්වාසදායක දේශීය සබඳතා හරහා ගෝලීය මට්ටමේ උසස් ප්‍රවාහන විසඳුම් ශ්‍රී ලාංකික පාරිභෝගිකයන් වෙත ළඟා කිරීමට ආයතනය දක්වන අඛණ්ඩ කැපවීම මැනවින් කියාපාන්නකි.

## බ්‍රිතාන්‍යයෙන් ලංකාවට පූර්ණ විශ්වවිද්‍යාල ශාඛාවක් UNIVERSITY OF WEST LONDON SRI LANKA BRANCH CAMPUS

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුවිශේෂ සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, බටහිර ලන්ඩන් විශ්වවිද්‍යාලය (University of West London - UWL) විසින් මෙරට ප්‍රථම පූර්ණ බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාල ශාඛා පරිශ්‍රය වන, University of West London Sri Lanka Branch Campus නිල වශයෙන් විවෘත කරනු ලැබීය.

බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලයක උසස් අධ්‍යාපන අත්දැකීම ශ්‍රී ලාංකික සිසුන්ට සමීප කරවීම මෙම ශාඛා පරිශ්‍රය සැලසුම් කිරීමේ මූලිකම අරමුණයි. ජාත්‍යන්තරව පිළිගත් අධ්‍යාපනයක් ලබාදීමේ දශක දෙකකට අධික අත්දැකීම් ඇති, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුරෝගාමියකු වන ANC කැම්පස් (ANC Campus) ආයතනය මෙම විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් හවුල්කරු ලෙස කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ රැඳී සිටිමින්ම ලෝක මට්ටමේ බ්‍රිතාන්‍ය උපාධි හැදෑරීමේ හැකියාව මෙරට සිසුන්ට හිමිවීම මෙමගින් හිමිවන මහඟු අවස්ථාවකි. මෙහි අධ්‍යයන කටයුතු, ඇගයීම් සහ ගුණාත්මකභාවය සහතික කිරීමේ



ක්‍රියාවලිය (Quality Assurance) බටහිර ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ප්‍රමිතීන්ට අනුකූලව සිදුකෙරෙන අතර, පාඨමාලා සහ උපාධි පිරිනැමීම් පිළිබඳ පූර්ණ අධ්‍යයන අධීක්ෂණ කටයුතුද විශ්වවිද්‍යාලය මගින් සෘජුවම සිදුකරනු ලබයි.

## AI වලින් බිස්නස් දියුණු කරන හැටි කියපු AI CATALYST SYMPOSIUM SRI LANKA

**AI ආයෝජනවලින් සැබෑ ව්‍යාපාරික ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ප්‍රායෝගික මාර්ග විවෘත කරයි**

NeenOpal සමාගම, Amazon Web Services (AWS) සමග එක්ව, දේශීය ව්‍යවසායක නායකයන්, තාක්ෂණික වෘත්තීයවේදීන්, කර්මාන්ත විශේෂඥයන් සහ ඉහළ ව්‍යාපාරික ප්‍රධානීන් රැසකගේ සහභාගිත්වයෙන් පැවැත්වූ 2026 AI Catalyst Symposium Sri Lanka සම්මන්ත්‍රණය පසුගියදා කොළඹ දී සාර්ථකව පැවැත්වීය.

මෙය කෘත්‍රිම බුද්ධිය (AI) පිළිබඳ පර්යේෂණාත්මක මට්ටම ඉක්මවා සාර්ථක ක්‍රියාත්මක කිරීම හරහා මැනිය හැකි ව්‍යාපාරික ප්‍රතිඵල ලබාගැනීම පිළිබඳ සාකච්ඡා කළ වැදගත් වේදිකාවක් බවට පත්විය.

"AI Ambition සිට AI Execution දක්වා" යන තේමාව යටතේ පැවති මෙම සම්මන්ත්‍රණය, වර්තමානයේදී ආයතන මුහුණ දෙන අතිශය වැදගත් අභියෝගයක් වන AI විසඳුම් විශාල පරිමාණයෙන් ක්‍රියාත්මක කිරීම සහ AI සඳහා සිදුකරන ආයෝජන



සැබෑ ව්‍යාපාරික වටිනාකමක් බවට පරිවර්තනය කිරීම කෙරෙහි අවධානය යොමු කළේය.

## මඩකළපුවේ සිසුන්ට බ්‍රැන්ඩික්ස් සත්කාරය

brandix inspired solutions

බ්‍රැන්ඩික්ස් සමූහය දීර්ඝ කාලයක පටන් මෙරට සියලු දරු දැරියන්ට හා පුරවැසියන්ට හිතකර පරිසරයක් හා නිසි අධ්‍යාපනයක් නිර්මාණය කිරීම සඳහා කැපීපෙනෙන මෙහෙවරක් ඉටුකරමින් සිටී. මේ අවස්ථාවද බ්‍රැන්ඩික්ස් සමූහය සිය අධ්‍යාපනික හා ප්‍රජා සත්කාර මෙහෙවරේ තැබූ තවත් ඉදිරි පියවරකි.

මෙරට ප්‍රමුඛතම ඇඟලුම් නිෂ්පාදකයා වන බ්‍රැන්ඩික්ස් සමාගම දෙහිඕවිට සහ ආණ්ඩිඅම්බලම යන ප්‍රදේශවල පාසල් සිසුන් සඳහා හා මඩකලපුව ප්‍රදේශයේ ජනතාවගේ සනීපාරක්ෂාව වෙනුවෙන් වැසිකිළි කාමර 34ක් ඉදිකර දී එය ජනතා අයිතියට පැවරීම පසුගියදා සිදුකෙරිණි.

එම ව්‍යාපෘතිය මගින් පාසල් සිසුන් සහ පුද්ගලයන් 900කට අධික පිරිසකට ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සනීපාරක්ෂක පහසුකම් සැපයෙන අතර, බ්‍රැන්ඩික්ස් සමූහය දිවයින පුරා ප්‍රජාවන්ට සැලකිලිමත් වීමේ සහ බලගැන්වීමේ මෙහෙවර තවදුරටත් සිදුකරමින් පවතී.

## හිල්ටන් එකේ තිබ්බ EV මෝටර් ෂෝ




2026 ජූනි 19 වැනි සිකුරාදා ප.ව. 5.30ට කොළඹ 2 යූනියන් පෙදෙසේ පිහිටි Hilton Colombo Residences හිදී Colombo EV Motor Show 2026 හිදී ප්‍රදර්ශනට අදාළ මාධ්‍ය හමුව සාර්ථකව පැවැත්විණි.

ශ්‍රී ලංකාවේ විද්‍යුත් වාහන ක්ෂේත්‍රයේ වඩාත්ම අපේක්ෂිත හා ජාත්‍යන්තර පිළිගැනීමක් හිමි ප්‍රදර්ශනයක් වන Colombo EV Motor Show 2026, Asia Exhibition & Conventions (Pvt) Ltd ආයතනය විසින් අඛණ්ඩව තෙවැනි වරටත් සංවිධාන කරනු ලබයි.

මෙවර ප්‍රදර්ශනය 2026 ජූනි 26 සිට 28 දක්වා දින තුනක් පුරා පෙ.ව. 10 සිට රාත්‍රි 9 දක්වා කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය (BMICH) පරිශ්‍රයේදී පැවැත්වේ.

## ABANS අරන් ආ XIAOMI 17T



සිය සන්නාමයේ දේශීය ගමන සනිටුහන් කරමින් Xiaomi Sri Lanka සමාගමේ නවතම Xiaomi 17T ස්මාර්ට් ජංගම දුරකතනය වෙළෙඳපොළට හඳුන්වා දීම සහ Abans දායකත්වයෙන් One Galle Face Mall හි පහළ මාලයේදී නවතම Xiaomi ප්‍රදර්ශනාගාරය විවෘත කිරීම පසුගියදා සිදුවිය. මෙරට තුළ සිය සන්නාමයේ වර්ධනය සහ ශ්‍රී ලාංකික පාරිභෝගිකයන්ට වඩාත් දියුණු තාක්ෂණය මෙන්ම අන්තර්ජාලය හරහා සම්බන්ධ කළ හැකි උපාංග සහ විශිෂ්ට පාරිභෝගික අත්දැකීමක් ලබාදීම වෙනුවෙන් Xiaomi සිදුකරන කැපවීම මේ තුළින් මනාව පිළිඹිබු වේ. "Step into a smarter world with Xiaomi," තේමාව යටතේ පැවැති මෙම සුවිශේෂ උත්සවය සඳහා මාධ්‍යවේදීන්, ව්‍යාපාරික හවුල්කරුවන්, තාක්ෂණ ලෝලීන් සහ පාරිභෝගිකයන් රැසක් එක්ව සිටියහ. එදින One Galle Face Mall හිදී විවෘත කරනු ලැබූ නව ප්‍රදර්ශනාගාරය තුළින් පාරිභෝගිකයන්ට Xiaomi ස්මාර්ට් ජංගම දුරකතන, smart home නිෂ්පාදන, එදිනෙදා තාක්ෂණය සහ සම්බන්ධතා උපාංග පිළිබඳ අත්දැකීමක් ලබාදීමට අපේක්ෂා කරනු ලබයි.

## ප්‍රමුඛ අපනයන අංශ 8ක් ජාතික අපනයන සැලැස්ම දියත් කෙරේ



අපනයන විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා 'තිරස් අංශ' හයක් (Horizontals) සහ 'ප්‍රමුඛ අපනයන අංශ' අටක් (Verticals) හඳුනා ගැනේ. ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, 2026-2030 කාලසීමාව සඳහා වන ජාතික අපනයන සංවර්ධන සැලැස්ම (NEDP) 2026 ජූනි 16 වැනි දින නිල වශයෙන් දියත් කරන ලදී.

මෙම අවස්ථාව සඳහා ප්‍රධාන අමුත්තා වශයෙන් කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති මහතා සහභාගි විය. එසේම, කම්කරු අමාත්‍ය හා මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා ඇතුළු රජය නියෝජනය කරමින් අමාත්‍යවරුන්ද, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය චතුරංග අබේසිංහ මහතා ඇතුළු නියෝජ්‍ය අමාත්‍යවරුන් රැසක්ද මෙයට එක්ව සිටියහ.

# අවුරුදු 5 යන්නත් බැරි වුණා
## පළාත් පාලන ඡන්දෙත් පැරදුණා
# ලොකු බලයකින් බලයට ආ බ්‍රිතාන්‍ය අගමැති අවුරුදු දෙකෙන් ගෙදර ගියා




**'හරියටම මීට අවුරුදු දෙකකට පෙර මෙම 'ඩවුනින්' වීදියේ ඇවිද ආ ගමන මගේ ජීවිතයේ ආඩම්බරම මොහොතයි. අවුරුදු 14කට පස්සේ මහා බ්‍රිතාන්‍යයේ (එංගලන්තයේ) නව කම්කරු රජයක් පිහිටුවීමට මම නායකත්වය දුන්නා. මෙලෙස අපේ රටේ ඉතිහාසයේ නව පිටුවක් පෙරළුණේ වසර ගණනාවක බලාපොරොත්තු සුන්වීමකින් සහ කඩවීමකින් පසුවයි. මිලියන සංඛ්‍යාත ජනතාවගේ ජීවිත යහපත් අතට හැරවීම සඳහායි මම දේශපාලනයට ආවේ. ඒ තැනට යන ගමන මට ලෙහෙසි වුණේ නැහැ. මෙයට අවුරුදු හයකට පෙර මට නායකත්වය දීමට උරුම වුණේ දේශපාලනිකව මූල්‍යමය වශයෙන් සහ සදාචාරාත්මකව බංකොලොත් වූ කම්කරු පක්ෂයක්. එහෙත් මම ඒ විශාල අභියෝගය භාරගත්තා. ඒ නිසා 2024 මහ ම ැතිවරණයේදී බ්‍රිතාන්‍යයේ ඉතිහාසය වෙනස් කරමින් අපේ කම්කරු පක්ෂය අතිවිශාල බහුතරයක් ලබාගනිමින් රටේ බලයට පැමිණියා. එය අතිවිශිෂ්ට ජයග්‍රහණයක් බවට පත්වුණා.'**

කුමක්ද මෙලෙස ඇසෙන කතාන්දරය? මෙය කියා සිටින්නේ කවරකු විසින්ද? මෙය ඇසෙන විටදී අපට පැහැදිලිවම හැඟී යන්නේ එය යම් රටක රාජ්‍ය පාලකයකු විසින් සිදුකරනු ලබන ප්‍රකාශයක් බවයි. ඔව්. එය සත්‍ය වශයෙන්ම එවැන්නකි. එම පාලකයා නොහොත් රාජ්‍ය නායකයා කවරෙක්දැයි සොයා බැලීමට ප්‍රථම ඔහුගේ අදහස් ප්‍රකාශය තවදුරටත් කියන්නේ කුමක්දැයි සොයා බලමු.

'මගේ නායකත්වය යටතේ පිහිටුවූ කම්කරු රජයෙන් මහා බ්‍රිතාන්‍යය තුළ පොරොන්දු වූ වෙනසක් ඉටුකිරීමට අපට හැකි වුණා. වසර 17ක් පුරා ජාතික වෛද්‍ය සේවය **(NHS of UK)** තිබුණු ප්‍රශ්න රාශියක් විසඳීමට අපට හැකි වුණා. දවසේ පැය 24/7 පුරා ක්‍රියාත්මක වන රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන, රෝග වැළැක්වීමේ නව ව්‍යාපෘති, වෛද්‍ය ඩිජිටල් පරිවර්තනය සහ තවත් නව සැලසුම් අපි ආරම්භ කළා. ලක්ෂ 5ක පමණ කුඩා දරුවන් දරිද්‍රතාවයෙන් මුදාගැනීමට වසර පහක සැලැස්මක් දියත් කළා. එම දරුවන්ට නොමිලේ ආහාර සැපයීම සිදුකළා. මේ අතර සමස්ත අඩු ආදායම්ලාභී පවුල්වලට ආහාර සපයා ගැනීම සඳහා විශේෂ අරමුදල් ස්ථාපිත කළා. අවශ්‍යතා ඇති පවුල්වලට නිවාස, රැකියා, ජල විදුලි බිල්පත් සහන, වැටුප් හා ප්‍රතිලාභ ලබාදීම් සිදුකළා. මේ ආකාරයට අපගේ රජය අවුරුදු දෙකක් වැනි ඉතා කෙටි කාලයක් තුළදී ජනතාව වෙනුවෙන් මහත් මෙහෙවරක් ඉටුකළා. තත්ත්වය එසේ තිබියදී මෙවැනි යම් අර්බුදයකට අපගේ රජය මුහුණ දුන්නා. එහෙයින් එහි නායකයා වශයෙන් මමද ඒ ප්‍රශ්නයට මැදිවී සිටිනවා...'

දැන් ඔබ මෙම කතාවේ යම් සන්ධිස්ථානයකට පැමිණ සිටින්නේය. මෙලෙස යම් අර්බුදයකට මැදිවුණු ලෝක රාජ්‍ය නායකයා කවරෙක්ද? අපට මෙම කතාව ලොව ප්‍රධානතම රාජ්‍යයක් වන මහා බ්‍රිතාන්‍යයෙන් අසන්නට ලැබුණේ මෙයට දින කිහිපයකට පෙරදීය. එනම් මෙලෙස මතභේදාත්මකව අර්බුදයකට ලක්වූ සුවිශේෂ රාජ්‍ය නායකයා වන්නේ මහා බ්‍රිතාන්‍යයේ වත්මන් අගමැති කීර් ස්ටාර්මර් (Keir Starmer)ය. මෙම පුවත ලෝකයේ සියලුම පාහේ මාධ්‍ය මගින් වාර්තා කරන ලද ප්‍රධානතම පුවතක් විය. එනම් බ්‍රිතාන්‍යයේ අගමැති කීර් ස්ටාර්මර් එරට අගමැති ධුරයෙන් සහ බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයේ නායක ධුරයෙන් ඉල්ලා අස්වීමට තීරණය කළ බව නිවේදනය කළේය. ඔහු අගමැති කාර්යාලයෙන් පිටත නිල උත්සවයකට සහභාගී වෙමින් ඒ බව ප්‍රකාශ කර සිටියේය. 2024 ජූලි 05දා මහ මැතිවරණයක් හරහා අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබාගනිමින් ඔහු බ්‍රිතාන්‍යයේ අගමැති ධුරයට තේරී පත්විය. එලෙස එංගලන්තයේ 57 වැනි අග්‍රාමාත්‍යවරයා ලෙස පත්වූ ඔහුට අතිවිශාල ජනතා ප්‍රසාදයක් හිමිවිය. එනම් එංගලන්තයේ පාර්ලිමේන්තුවේ ආසන 650න් කීර් ස්ටාර්මර්ගේ නායකත්වයෙන් යුත් කම්කරු පක්ෂය ආසන 412ක්ම දිනාගත්තේය. එවක එරට හිටපු අගමැති රිෂි සුනාක්ගේ කොන්සර්වේටිව් පක්ෂය දිනාගත්තේ ආසන 121ක් පමණි. අගමැති ධුරය සහ පක්ෂ ජයග්‍රහණය සඳහා ආසන 326ක බහුතරය ලබාගත යුතුව තිබුණු අතර, එය ඉතා පහසුවෙන් කීර් ස්ටාර්මර් විසින් හිමිකර ගත්තේය. මේ හෙයින් ඉතිහාසගත වාර්තාවක් තබමින් ඔහු ජයග්‍රහණය හිමිකර ගැනීමට සමත් විය.

මහාමේරුවක් මෙන් මෙසේ වාර්තාගත ජයග්‍රහණයක් හිමිකරගත් කීර් ස්ටාර්මර් නමැති නායකයාට අද සිදුව ඇත්තේ කුමක්ද? එනම් එංගලන්තයේ අගමැති ධුරයේ වසර 2ක් වැනි ඉතා කෙටි කාලයක් සිට බලයෙන් ඉවත් වීමට ඔහුට සිදුවූයේ කුමන අර්බුදයක්ද? එංගලන්තයේ සාම්ප්‍රදායිකව බලයෙහි සිටින්නේ එරට සිටින රජ පවුලයි. එහෙත් ප්‍රජාතාන්ත්‍රිකව මැතිවරණයකින් බලයට පත්වන බලගතු නායකයා වන්නේ අගමැතිවරයායි. එංගලන්තයට ජනාධිපති ධුරයක් නැති හෙයින් බලගතු රාජ්‍ය පාලකයා වන්නේ අගමැතිවරයායි. දැන් එසේ නම් වන්නේ අගමැති කීර් ස්ටාර්මර්ට වසර දෙකක් වැනි කෙටි පාලන කාලයක් තුළදී අගමැති පුටුවෙන් බැස ගෙදර යෑමට සිදුව ඇත. එංගලන්තයේ මහ මැතිවරණයක් පවත්වනු ලබන්නේ වසර 5කට වතාවක් වන අතර, එහිදී අගමැති ධුරය ජයගැනී නායකයා තේරී පත්වෙයි. එහෙත් අන් රටවල මෙන් නොව එංගලන්තයේ අගමැති ධුරයට කාලසීමාවක් නොමැත. එනම් ඔවුන්ගේ අදාළ දේශපාලන පක්ෂයේ සහාය පවත්වාගෙන යනතාක් සහ මහජන මන්ත්‍රී මණ්ඩලයේ බහුතරයක් ඇතිනාක් කල් අගමැති ධුර කාලයේ බලය පවතී. අඛණ්ඩව මහ මැතිවරණ ජයග්‍රහණය කරමින් තම පක්ෂ නායකත්වය රඳවා ගන්නේ නම් අගමැතිවරයකුට අසීමිත වාර ගණනක් ධුරය දැරිය හැකිය. කෙසේ වෙතත් මෙවැනි තත්ත්වයක් යටතේ අදාළ පක්ෂයේ කැමැත්ත නොමැති නම් අගමැතිවරයාට ඉවත් වීමට හෝ ඉල්ලා අස්වීමට හෝ සිදුවනු ඇත. දැන් එසේ නම් වන්නේ අගමැති කීර් ස්ටාර්මර්ට සිදුව ඇත්තේ එවැන්නක්ද? ඔහු මෙයට දින කිහිපයකට ඉහතදී අගමැති ධුරයෙන් ඉල්ලා අස්වීමට හේතුවූ වටපිටාව කුමක්දැයි සොයා බලමු. එය මෙසේ විග්‍රහ කෙරෙයි.

වත්මන් බ්‍රිතාන්‍ය අගමැතිවරයාට ඉල්ලා අස්වීමට හෝ බලයෙන් පහවීමට හෝ හේතු සාධක වූ කරුණු විවිධ විශ්ලේෂකයන් හරහා මෙසේ ගෙනහැර දක්වා ඇත.

- පසුගිය බ්‍රිතාන්‍ය පළාත් පාලන මැතිවරණයේදී කම්කරු පක්ෂය දැඩි පරාජයකට ලක්විය. මෙහිදී කම්කරු පක්ෂ නායක කීර් ස්ටාර්මර්ගේ මනාපේක්ෂක ප්‍රතිපත්ති බලපෑම ලක්වුණේ යැයි හෙළිවිය. පක්ෂයේ අභ්‍යන්තර කැරැල්ලක් ඇති බවට කරුණු හෙළිවිය.
- බ්‍රිතාන්‍ය කැබිනට් අමාත්‍යවරුන් කිහිප දෙනකු තම තනතුරුවලින් ඉල්ලා අස්වීම. මෙම වටපිටාවේදී කම්කරු පක්ෂයේ මන්ත්‍රීවරුන් 90ක් පමණ අගමැති කීර් ස්ටාර්මර්ට ඉල්ලා අස්වන ලෙසට බලකරනු ලැබුවේය.
- ඇමෙරිකාවේ බ්‍රිතාන්‍ය තානාපතිවරයා ලෙස පීටර් මැන්ඩල්සන් නමැති රාජ්‍යතාන්ත්‍රිකයා පත්කිරීම. මොහු ලොව ප්‍රකටව සිටි ධනවත් ලිංගික අපරාධකරුවෙකු වූ ජෙෆ්රි එප්ස්ටයින් සමග සමීප සබඳතක් පැවැත්වූ බවට කරුණු හෙළිවිය. මේ නිසා කීර් ස්ටාර්මර් ගත් තීරණය දැඩි ලෙස විවේචනයට සහ අපකීර්තියට ලක්විය.
- වසර දෙකක කෙටි කාලයක් තුළදී බ්‍රිතාන්‍ය ජනතාවගේ ජනප්‍රියත්වයෙන් ගිලිහී ගිය බැව් සමජ සමීක්ෂණ මගින් හෙළිවනු ලැබීම සහ එම ශ්‍රේණිගත කිරීම් පහළ වැටීම.

කෙසේ හෝ මෙවැනි තත්ත්වයක් යටතේ බ්‍රිතාන්‍ය අගමැතිවරයා පසුගියදා ඉල්ලා අස්වීම ප්‍රකාශ කරමින් කියා ඇත්තේ ඊළඟ මහ මැතිවරණයට නායකත්වය දීමට සුදුසුම පුද්ගලයා තමා නොවන බවය. මෙම වසරේ සැප්තැම්බර් මාසයේදී නායකයකු පත්කර ගැනීමේ අරමුණෙන් ඉදිරි ජූලි මාසයේදී නාමයෝජනා ආරම්භ කරන ලෙසටත්, එතෙක් තමා අගමැති ධුරයේ රැඳී සිටින බවටත් කීර් ස්ටාර්මර් ප්‍රකාශ කර සිටියේය.

ආචාර්ය, ශ්‍රීමත් කීර් ස්ටාර්මර් (Sir Dr. Keir Starmer) යනු 63 වැනි වියේ පසුවන මහා බ්‍රිතාන්‍යයේ සිටින ඉතා පරිණත දේශපාලකයෙකි. ඔහු එරට 57 වැනි අග්‍රාමාත්‍යවරයා වන අතර, 2020 සිට 2024 දක්වා මහා බ්‍රිතාන්‍යයේ විපක්ෂ නායකවරයාය. එසේම ඔහු එංගලන්තයේ ඉතා පැරණි (වසර 126ක් පැරණි) දේශපාලන පක්ෂයක් වන බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයේ නායකත්වය 2020 සිට මේ දක්වා දරයි. කීර් ස්ටාර්මර් බොහෝ පරිණත විද්වත් පරිචයක් ඇති පුද්ගලයකු ලෙස ප්‍රකටය. ඔහු ලෝකයේ අතිශය ප්‍රකට කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වන එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් සහ ලීඩ්ස් විශ්වවිද්‍යාලයෙන්ද උසස් උපාධි හිමිකරගෙන ඇත. එසේම ඔහුට ලෝකයේ විවිධ විශ්වවිද්‍යාල හතරකින් ගරු ආචාර්ය උපාධිද පිරිනමා ඇත. බ්‍රිතාන්‍යයේ රාජකීය සම්මාන ගණනාවකින් පිදුම් ලබා ඇති ඔහු 2025 ප්‍රකට 'ටයිම්' සඟරාව විසින් නම් කරන ලද ලෝකයේ ප්‍රබලතම බලවත් පුද්ගලයන් 100 දෙනා අතරටද නම්කර ඇත.

ලෝකයේ කෙතරම් බලගතු, විරාජමාන රාජ්‍ය නායකයන් සිටියද ඔවුන්ගෙන් බොහෝ දෙනකු යම් කාලයකදී තම බලයෙන් ගිලිහී ගොස් බිමට ඇදගෙන වැටෙන අයුරු දක්නට හැකිය. තේජවන්ත අයුරින් බලය රැකගෙන ජනතාවගේද සිත් දිනාගෙන පාලනය ගෙනගිය පාලකයන්ද නැත්තේ නොවේ. එහෙත් වර්තමානයේ අපට බොහෝවිට අසන්නට ලැබෙන්නේ ඉතා ශෝකීය අයුරින් පාලනයෙන් ගිලිහෙන නායකයන්ය. ලෝකයේ මහා බලවතා වූ ඩොනල්ඩ් ට්‍රම්ප්ටද එය සිදුව හමාරය. මේ ආනිසංසය හෙට අනිද්දාම අපගේ ශ්‍රී ලංකාවටත් සිදුවනු ඇතිය.


ප්‍රියන්ත හෙට්ටිගේ

# විජයගෙන් පටන් අරන් ජෝති ගැන ලියන කවුද මේ ධම්මික?







**ග්‍රන්ථකරණයෙන් මෙරට සාහිත්‍ය කෙත පෝෂණය කරන සැඟවුණු දක්ෂයෙක් පිළිබඳ කෙටි සටහනකි මේ. නමින් ධම්මික ජයරංජන් වන ඔහු ගොතටුව නව නගරය ගම් පියසේ ඉපදී, කුඩා කල සිටම සාහිත්‍යයට ඇල්මක් දැක්වා, බොරැල්ල සුසමයවර්ධන මහා විදුහලෙන් අධ්‍යාපනය ලබා ඇත. එකල පාසල් බිත්ති පුවත්පත සාහිත්‍ය තරග සඳහා ඔහු නිරන්තර සිය නිර්මාණ ඉදිරිපත් කොට තිබිණි.**

කුඩා කල 'විජය' සහ 'මිහිර' ළමා පුවත්පත්වලට සම්බන්ධ වී ඇති ජයරංජන් මහතා, පසුව ජාතික පුවත්පත් රැසක පාඨක පිටුවලටද සම්බන්ධ වී ඇති අතර, අනතුරුව ප්‍රධාන පුවත් ලිවීමටද නැඹුරුවී ඇත.

මෙරට සිටි සදාදරණීය කලාකරුවකු වූ විජය කුමාරතුංගයන් පිළිබඳ ග්‍රන්ථයක් එළිදක්වමින් ග්‍රන්ථකරණයට පිවිසි ධම්මික ජයරංජන්, විජය ජීවත්ව සිටි සමයේ විවිධ අවස්ථාවල සිදුකළ ප්‍රකාශ ඇසුරෙන් 'ආදරණීය විජයගේ අදහස් අද සමාජයට' නමින් එම ග්‍රන්ථය සාහිත්‍ය ලෝකයට දායාද කළේ මීට වසර ගණනාවකට ඉහතදීය. එම පොත ලිවීමට විජයගේ සහෝදරියගේ සහ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී බන්දුල පද්මකුමාර මහතාගේ සහායද කතුවරයා විසින් ලබාගෙන ඇත.

එසේම 80 දශකයේ ජනප්‍රිය වූ යොවුන් පුවත්පත් දෙකක් වන 'සරසි' සහ 'සත්සර' පුවත්පත්වලින්ද සිය කෘතියට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට ධම්මික ජයරංජන් මහතා කටයුතු කර තිබිණි.

ජීවිතයේ එක් වරක් විජය කුමාරතුංගයන් තමන්ට මුණගැසී ඇති බව පවසන ධම්මික ජයරංජන් මහතා, එකල සිනමා රසිකයකු ලෙස තමන් විජයට ලිපි ලියා ඇති බවත්, එම ලිපිවලට විජය පිළිතුරු එවා ඇති බවත් සඳහන් කරන්නේ කෘතවේදීත්වය පෙරදැරිවය.

අනතුරුව අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ ග්‍රන්ථයක් එළිදැක්වීමට ධම්මික ජයරංජන් මහතා කටයුතු කළේ මෑතකදීය. 'දහම් පාසල් අධ්‍යාපනයේ අරමුණ සහ ආරම්භක පසුබිම' මැයෙන් රචිත එම ග්‍රන්ථය සඳහා කලපළුවාව මිහිඳු දහම් පාසලේ සියලු දෙනාගේද සහායද, කොළොන්නාව ශාසනාරක්ෂක බලමණ්ඩලයේ සහායද, හිටපු ප්‍රධානාචාර්ය ඩබ්ලිව්. එස්. බොතේජු මහතාගේ සහායද ලැබී තිබේ.

මෙම ග්‍රන්ථය, කතුවරයා විසින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අත්තනායක එම්. හේරත් මහතාට පිරිනැමූයේ කලපළුවාව මිහිඳු දහම් පාසල් පරිශ්‍රයේදීය.

එසේම 'දන්නා ගීයක සැඟවුණු අරුත්', 'හැදියාව සහ ළැදියාව (නැදුන්ගමුවේ ඇත් රජු), 'දිවිමග ජය - මවකගේ සිතුවිලි', 'චණ්ඩි' සහ 'අද අපි දකින, එදා කොසොල් රජු දුටු සිහින දහසය' වැනි වටිනා ග්‍රන්ථ රාශියක් ධම්මික ජයරංජන් මහතා රචනා කර ඇත.

මීට අමතරව මෙරට සිනමා ගී කෙත අස්වැද්දූ ප්‍රවීණ ගායන ශිල්පී එච්.ආර්. ජෝතිපාලයන්ගේ ජීවන ගමන ගැන සඳහන් කෘතියක්ද ධම්මික ජයරංජන් මහතා මේ වනවිට සම්පාදනය කරමින් සිටී.

මෙවන් වටිනා ග්‍රන්ථ රාශියක් දැයට දායාද කළ මාහැඟි සාහිත්‍යවේදියකු ලෙස හඳුන්වා දිය හැකි ධම්මික ජයරංජන් මහතා ඇගයීම සිංහල සාහිත්‍යයට ළැදි අප සැමගේ යුතුකමකි.

*චානක ලියනගේ*

# ආබාධ සහිත පුද්ගලයන් අන්තර්කරණය කරගත් රැකියා
## බඳවා ගැනීම් පිළිබඳ ආයතනික වටමේස සාකච්ඡාව - 2026 ජූනි 24



ChilFund Sri Lanka ආයතනය වසර 40කට අධික කාලයක් පුරා ශ්‍රී ලංකාවේ දරුවන් සහ තරුණයන් සෞඛ්‍යසම්පන්න, දැනුමෙන් හා කුසලතාවලින් සන්නද්ධ, ආරක්ෂිත සහ සවිබලගැන්වූ පුරවැසියන් ලෙස වර්ධනය වීමට අවශ්‍ය සහාය ලබාදෙමින් අඛණ්ඩව කටයුතු කරයි. රජයේ ආයතන, සිවිල් සමාජ සංවිධාන, ප්‍රජාවන් සහ පෞද්ගලික අංශය සමග සහයෝගීව කටයුතු කරමින්, ශ්‍රී ලංකාව පුරා වඩාත් අවදානමට ලක්වූ දරුවන්, තරුණ තරුණියන් සහ ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා අවශ්‍ය සේවා හා සහාය ලබා දෙයි. ස්ත්‍රී පුරුෂභාවය සහ ආබාධ සහිත පුද්ගලයන්ගේ අන්තර්කරණය (Inclusion in gender and disability) ChildFund SriLanka ආයතනයේ ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතා හතරෙන් එකක් වන අතර, අධ්‍යාපනය, ජීවනෝපාය සංවර්ධනය, ළමා ආරක්ෂාව සහ ප්‍රජා සංවර්ධනය ආශ්‍රිත සියලු වැඩසටහන් තුළ එය මූලික ප්‍රවේශයක් ලෙස ඒකාබද්ධ කර ඇත.

### ආබාධ සහිත පුද්ගලයන් අන්තර්කරණය කිරීම සඳහා ශක්තිමත් කැපවීම

ChilFund Sri Lanka ආයතනයේ 'ආබාධ සහිත පුද්ගලයන් අන්තර්කරණය කිරීමේ වැඩසටහන' යනු ආබාධ සහිත තරුණ තරුණියන්ගේ ආර්ථික සහභාගීත්වය ඉහළ නැංවීම, සමාජීය අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ දිගුකාලීන යහපැවැත්ම තහවුරු කිරීම අරමුණු කරගත්, පද්ධති ශක්තිමත් කිරීමේ පුළුල් වැඩසටහනකි. අධ්‍යාපනයට ඇති සීමිත ප්‍රවේශය, ප්‍රමාණවත් පුහුණු අවස්ථා නොමැති වීම සහ සමාජ අපවාදය වැනි බාධක හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන්ගෙන් ආසන්න වශයෙන් 70%ක් තවමත් රැකියා විරහිතව සිටීම යන බරපතළ ජාතික අභියෝගයට මෙම වැඩසටහන ප්‍රතිචාර දක්වයි. මෙම දැවැන්ත ජාතික අභියෝගයට ප්‍රතිචාර දක්වමින්, ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා සමාන අවස්ථා සහ තිරසාර ජීවනෝපාය මාර්ග ගොඩනැගීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. වසර දහයකට වැඩි කාලයක් පුරා ආබාධිතභාවය කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හරහා ලැබුණු අත්දැකීම් මත ගොඩනැගුණු මෙම වැඩසටහන, ආබාධ සහිත දරුවන් 12,000කට අධික පිරිසකට සහාය ලබාදී ඇති අතර, ආබාධ සහිත පුද්ගලයන්ගේ සංවිධාන (OPDs) ජාලයන් ශක්තිමත් කිරීමටද දායක වී ඇත. මෙම වැඩසටහන මගින් විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී සහ ආන්තීකරණයට ලක්වූ ප්‍රජාවන්ට අයත්, ශාරීරික, සංවේදන සහ ස්නායු සංවර්ධන ආබාධිතාවය සහිත වයස අවුරුදු 15-24 අතර තරුණ තරුණියන් සඳහා රැකියා සහ ව්‍යවසායකත්ව අවස්ථා වෙත ප්‍රවේශ වීමට හැකියාව සලසන තිරසාර මාර්ග නිර්මාණය කරයි. මෙම වැඩසටහන මගින් ප්‍රවේශ පහසුකම් සහිත රජයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හරහා වෙළෙඳපළ අවශ්‍යතා මත පදනම් වූ වෘත්තීය පුහුණු අවස්ථා ලබාදීම, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ මූල්‍ය සේවා වෙත සමාන ප්‍රවේශය සඳහා සහාය ලබාදීම, සමාන අවස්ථා නිර්මාණය කිරීමෙන්, ආබාධ සහිත පුද්ගලයන් බඳවා ගැනීම සහ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කරන පෞද්ගලික අංශයේ සංවිධාන සමග හවුල්කාරීත්වයන් ශක්තිමත් කිරීම සහ සමාජ ආරක්ෂණ අවස්ථා වෙත සමාන ප්‍රවේශය තහවුරු කිරීම සහ වෙනස් කොට සැලකීම අභියෝගයට ලක් කිරීම සඳහා අයිතිවාසිකම් මත පදනම් වූ උද්දේශන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම යන අංශ ඒකාබද්ධ කරයි. රජයේ පද්ධති ශක්තිමත් කිරීම, ආයතනික හැකියාවන් වර්ධනය කිරීම සහ වෙනම සමාන්තර සේවා පද්ධති නිර්මාණය කිරීම වෙනුවට, සියලු දෙනාගේ සමාන සහභාගීත්වය සහ ප්‍රවේශය තහවුරු කරන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පවතින පද්ධති තුළම ස්ථාපිත කිරීම මගින් ChildFund වැඩසටහනේ දිගුකාලීන තිරසාරභාවය තහවුරු කරයි. එමෙන්ම, ආබාධ සහිත තරුණ තරුණියන්ට ස්වාධීන සහ අර්ථවත් ජීවනෝපායන් ගොඩනගා ගැනීමට හැකිවන පරිදි ඔවුන් සවිබල ගන්වමින්, වඩාත් සාධාරණ හා සියලු පුරවැසියන්ට සමාන අවස්ථා හිමිවන ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට දායක වේ.

### සමාජ සේවා දෙපාර්තමේන්තුව සමග හවුල්කාරීත්වය

ආබාධ සහිත තරුණයන්ගේ වෘත්තීය කුසලතා සංවර්ධනය සහ රැකියා සඳහා ඇති හැකියාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින්, ChildFund Sri Lanka සමාජ සේවා දෙපාර්තමේන්තුව සමග දිගුකාලීන හා ශක්තිමත් හවුල්කාරීත්වයක් පවත්වාගෙන යයි. මෙම සහයෝගීතාව මගින් වෘත්තීය පුහුණු විෂය මාලා සංවර්ධනය, පුහුණු උපදේශකයන්ගේ ධාරිතාව වර්ධනය කිරීම, පුහුණු මධ්‍යස්ථානවල ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීම සහ පුහුණු සපයන්නන් හා සේවා යෝජකයන් අතර සම්බන්ධතා ශක්තිමත් කිරීම සඳහා වැදගත් දායකත්වයක් ලබාදී ඇත. වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව (DoSS) සමග එක්ව, වෙළෙඳපළ අවශ්‍යතා සහ රැකියා ක්ෂේත්‍රයේ ඉල්ලුමට ගැළපෙන වෘත්තීය පුහුණු පාඨමාලා හඳුන්වා දීමට ChildFund Sri Lanka දායක වී ඇත. එම වැඩසටහන් අතර ආගන්තුක සත්කාර සේවා (Hospitality), ග්‍රැෆික් නිර්මාණකරණය (Graphic Design), ජංගම දුරකතන අලුත්වැඩියා කිරීම, පේස්ට්‍රි හා බේකරි නිෂ්පාදනය, ස්වර්ණාභරණ නිෂ්පාදනය, බතික් නිෂ්පාදනය, පාවහන් කාර්මික ශිල්පය, කෘෂිකාර්මික පැළ තවාන් කළමනාකරණය, ජලනළ කාර්මික සහායකත්වය සහ අලෙවි සහායකත්වය (Sales Assistance) ඇතුළත් වේ.

### ජාතික ප්‍රමුඛතා සඳහා දායකත්වය

ChildFund Sri Lanka ආයතනයේ ආබාධ සහිත පුද්ගලයන් අන්තර්කරණය කිරීමේ වැඩසටහන, සමාජ අන්තර්කරණය, කුසලතා සංවර්ධනය, රැකියා අවස්ථා පුළුල් කිරීම සහ සමාන අවස්ථා තහවුරු කිරීම යන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රමුඛතා සඳහා සෘජුවම දායක වේ. සේවා නියුක්තිය සඳහා අවශ්‍ය කුසලතා හා හැකියාවන් වර්ධනය කිරීම, වෘත්තීය පුහුණු අවස්ථා වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම, ආබාධ සහිත පුද්ගලයන් සඳහා සමාන අවස්ථා, ගෞරවය සහ සාධාරණ පහසුකම් සහිත සේවා ස්ථාන ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම මගින්, ChildFund Sri Lanka ආබාධ සහිත පුද්ගලයන්ට ආර්ථික ක්‍රියාකාරකම්වලට සමානව දායක විය හැකි පරිසරයක් ගොඩනැගීමට කටයුතු කරයි.